සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

06 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසට අයත් වන සාහිත්‍යමය මූලාශ්‍රයක් ලෙස ...................................... දැක්විය හැකිය.

( මහාවංශය / දීප වංශය / චූල වංශය)

02 පොළොන්නරුවේ ගල් විහාරය ........................................................................................ රජුගේ නිර්මාණයකි.

(I විජයබාහු / මහසෙන් / I පරාක්‍රමබාහු)

03 මහසෙන් රජු ජීවත් වූයේ ක්‍රිස්තු වර්ෂ ........................................................................ දී බව පිළිගෙන ඇත.

(250 / 274 / 200)

04 බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ ........................................ ගේ උත්පත්තියට පෙර එනම් අවුරුදු 544 කට පෙරය.

(බුදුන් වහන්සේ / ක්‍රිස්තුස් වහන්සේගේ / මහමත්තුමා)

05 ක්‍රිස්තු වර්ෂයෙන් 78 දී ........................................................................................ වර්ෂ ක්‍රමය ආරම්භ වේ.

(ශක / ක්‍රිස්තු / හිජ්රි)

- අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල යොදන්න.

06 ක්‍රිස්තු වර්ෂ 622 දී ඉස්ලාම් ආගමික නායකයා මක්කම සිට මදීනා නගරයට පැමිණීම නිසා එදින සිට හිජ්රි වර්ෂ ක්‍රමය ඇරඹේ. ( )

07 පෘථිවිය සෑදෙන අවස්ථාවේ එය මහත් උණුසුමකින් පැවති අතර වර්තමානයේ එය මුළුමනින්ම සිසිල් වී ඇත. ( )

08 මහා හිම යුගයේ පැවති අධික ශීතල හා දේශගුණය මානව පරම්පරාවක ආරම්භයට හේතු විණි. ( )

09 මිනිසා බිහිවීම ආරම්භ වන්නේ දැනට අවුරුදු දශලක්ෂ දෙක හමාරකට පෙරය ( )

10 පළමු වරට පෘථිවියේ ගොඩබිම පහල වූයේ සත්ව වර්ග වේ. ( )

- අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11 මහා හිමයුගය පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මිනිසා බිහිවීම (2) ශාක බිහිවීම (3) සතුන් බිහිවීම (4) කෙටි උණුසුම් කාලය

12

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අවු.ද.ල. 3.8 කට පෙර | ← | අවු.ද.ල. 2.5 කට පෙර | ← | අවු.ද.ල. 02 කට පෙර | ← | අවු.ද.ල. 01 කට පෙර | ← | ⊙ වර්තමානය |
| A | | B | | C | | D | | |

ඉහත සටහනට අනුව හෝමෝ හැබිලස් හෙවත් හැකි මිනිසා බිහිවූ යුගය වන්නේ මෙයින් කවරක් ද?

(1) A (2) B (3) C (4) D



LIVEWORKSHEETS

13 විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කරමින් නිවාස ඉදිකළ මානව වර්ගය වන්නේ මින් කවරෙක් ද?

(1) හෝමෝ නියැන්ඩතාලෙන්සිස්  (2) ඔස්ට්‍රලෝපිතිකස්

(3) හෝමෝ ඉරෙක්ටස්  (4) හෝමෝ හැබිලස්



14 අතීතයේ මිනිසා විසින් සකස් කරන ලද කාන්තා රූපයක් මෙහි දැක්වේ. එය සාදන ලද යුගය කුමක් දැයි මේවායින් තෝරන්න.

(1) පුරා ශිලා යුගය

(2) මධ්‍ය ශිලා යුගය

(3) නව ශිලා යුගය

(4) නූතන යුගය

15 ඉහත නිර්මාණය සිදු කරන ලද්දේ මින් කවර ද්‍රව්‍යයකින් දැයි දක්වන්න.

(1) දැව  (2) පාෂාණ  (3) මැටි  (4) සත්ව ඇට

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල A තීරුවට ගැලපෙන පිළිතුරු B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | **A තීරුව** | | **B තීරුව** |
|---|---|---|---|
| 16 | පුරා ශිලා යුගය | A | නව ශිලා යුගය |
| 17 | දුනු ඊතල භාවිතය | B | ක්‍රි. පූ. 3000 |
| 18 | සත්ත්ව ආහාර නිෂ්පාදනය | C | මහා හිම යුගය |
| 19 | මානව පරිණාමය | D | ගුරු ගල් මගින් වර්ණ සැදීම |
| 20 | මැටි දැකැත්ත | E | මධ්‍ය ශිලා යුගය |



LIVEWORKSHEETS